**බදුල්ල මහා නගර සභාව - 2022**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බදුල්ල මහා නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 වන අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට බදුල්ල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී ගල්කන්ද ක්‍රීඩාපිටිය පවරා ගැනීම වෙනුවෙන් බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර තිබුණු රු 8,000,000.ක තක්සේරු ගාස්තු මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැඟිලි වැඩිදියුණු කිරීමේ වියදම් ලෙස දක්වා තිබුණි. | මෙම වසරේ නිවැරදි කර ජංගම නොවන වත්කම්වල ඉඩම් හා ගොඩනැඟිලිවලට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |
| (ආ) | 2015 වර්ෂයේදී සභාවේ ගිලන්රථය අළුත්වැඩියා කිරීම වෙනුවෙන් බාහිර පාර්ශවයකට ගෙවිය යුතුව තිබුණු රු.318,250 ක් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ ජංගම වගකීම් ලෙස ගිණුම් ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසාන ගිණුම් මඟින් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. තවද මෙම වර්ෂයේදී ඒ සඳහා ගෙවීම් නොකරන්නේ නම් අසම්භාව්‍ය බැරකමක් ලෙස ණයහිමි ලේඛනට ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන සහායක ව්‍යාපෘතියේ ප්‍රතිපාදන මත මිලදී ගෙන තිබුණු රු.706,000 ක යන්ත්‍රෝපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | අවසාන ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව . | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.8,533,580 ක් වුවද, එය රු.8,306,934 ක් ලෙස මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ උසාවි දඩ ආදායම රු.2,193,896 ක් වුවද, එය රු.1,967,240 ක් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | වර්ෂ අවසාන ගිණුමෙන් ගැලපීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු 49,000,596.ක් වුවද එය රු.35,451,725 ක් ලෙස මූල්‍ය මෙහෙයුම් පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ හිටි මුද්දර ගාස්තු ආදායම රු.34,396,764 ක් වුවද, එය රු.20,847,893 ක් ලෙස මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය ආරම්භ නොකළ කර්මාන්තයක් සහ වැඩ නිමි වාර්තාව නොමැති කර්මාන්තයක් වෙනුවෙන් රු 3,245,495.ක ණයහිමි ප්‍රතිපාදන වෙන් කර තිබුණි. | එක් කර්මාන්තයක් ගිවිසුම් ගත වී ඇති නිසා ණයහිමි ලේඛනයට ඇතුළත් කළ අතර ව්‍යාපෘතිය ආරම්භ නොකළ කර්මාන්තය සඳහා ඇස්තමේන්තු මුදල ඇතුළත් කරන ලද බව. | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ ණයහිමි ශේෂය තුළ ඇතුළත් නිරවුල් කර තිබුණු රු.1,706,003 ක කර්මාන්ත ණයහිමි ශේෂයක් ඇතුළත් කර තිබුණි. | ව්‍යාපෘති දෙක සඳහා ණයහිමියන් ලෙස ඇතුළත් කර ඇති මුදල 2023 අවසාන ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත උපකරණ ගිණුමේ ශේෂය රු.1,030,211,523 ක් වුවද, ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීම සහ විවිධ පරිත්‍යාග ගිණුම් එකතුව රු.1,026,781,080 ක් වශයෙන් මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනයේ දක්වා තිබුණි. | 2015 වර්ෂයට පෙර සිට ඉදිරියට පැවත එන ශේෂයකි. 2023 වර්ෂයේ අවසාන ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වටිනාකම රු.1,872,710 ක් වූ අහරු චෙක්පත් ගිණුම් ශේෂය සම්බන්ධව අහරු චෙක්පත් ලේඛනය, චෙක්පත් ලැබුණු දිනය, ලැබුණේ කාගෙන්ද, කුමන කාරණයක් සඳහාද ආදී සාක්ෂි ඉදිරිපත් නොකිරිම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | සාක්ෂි සොයා ගත නොහැකි බැවින් කමිටුවක් මඟින් තවදුරටත් සොයා බැලීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| xxiv පරිච්ඡේදයේ 4 ඡේදය | සේවය අතහැර ගිය සහ අයවීම් හිඟහිට වී ඇති සේවකයින් 24 දෙනෙකුගෙන් වසර 10 කට පෙර සිට අයවිය යුතු රු. 823,936 ක හිඟ ණය ශේෂ සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාද අය කරගෙන නොතිබුණි. | සේවය අතහැරගිය සහා අයවීම් අත්හිටු වී ඇති නිලධාරීන් දෙනෙකු 22 සිටින අතර ස්ථාන මාරු වී ගිය ආයතන වෙත අයකර ගැනීමට ලිපි යොමු කර ඇති බව. | හිඟ හිටි සේවක ණය කඩිනමින් අය කරගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| මුදල් රෙගුලාසි 104 (4) | බදුල්ල මහා නගර සභාවට අයත් ගිලන් රථයක් 2014 ජුනි 16 දින කිරිඇල්ල ප්‍රදේශයේදී අනතුරකට පත්වී තිබුණි. අනතුර පිළිබඳ පූර්ණ වාර්තාව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවසන් වාර්තාව පළාත් පාලන දෙපාර්තමේන්තුව මගින් පළාත් සභාවට යොමු කර ඇති අතර එහි අඩුපාඩු පවතින බවට නැවත පළාත් පාලන දෙපාර්තමේන්තුවට ලිපියක් මඟින් යොමු කර ඇති බව. | මුදල් රෙගුලාසි අනුව අනතුරු සිදු වී මාස 03ක් ඇතුළත පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 40,985,192 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.41,059,734 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල්කළ ආදායම | 2022 රැස්කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල්කළ ආදායම | 2021 රැස්කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 24,960,000 | 13,732,830 | 7,595,197 | 6,137,633 | 24,960,000 | 18,202,787 | 9,981,382 | 8,221,405 |
| (ii) | කුලී | 54,318,701 | 54,439,651 | 47,963,609 | 6,476,042 | 54,318,701 | 30,365,594 | 27,400,211 | 2,965,383 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 19,122,500 | 18,736,414 | 17,376,264 | 1,360,150 | 23,222,500 | 15,681,367 | 14,886,842 | 794,525 |
| (iv) | වෙනත් | 18,348,000 | 15,755,208 | 12,235,655 | 3,519,553 | 18,348,000 | 10,400,480 | 7,394,074 | 3,006,406 |
| | එකතුව | 116,749,201 | 102,664,103 | 85,170,725 | 17,493,378 | 120,849,201 | 74,650,228 | 59,662,509 | 14,987,719 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 2 කට අධික කාලයක සිට පැවත එන හිඟ හිටි වරිපනම් බදු රු.15,214,562 ක් වෙළඳකුටි ගාස්තු රු.1,782,000 ක්, කඩ සාප්පු කුලී රු.1,125,625 ක්, සාප්පු බදු කුලී රු. 695,769ක්, උමං මාර්ග කඩ කුලී රු.837,600 ක් සහ හ රථගාල්වල රථවාහන නවතා තැබීමේ ගාස්තු රු.13,870,215 ක් සමාලෝචිත වර්ෂයේදිද අය කරගෙන නොතිබුණි. | අය කර ගැනීමට කටයුතු කරන බව. | අදාළ නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගෙන කඩිනමින් හිඟ ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.490,901 ක් සහ මුද්දර ගාස්තු රු.10,995,079 ක් ගෙන්වාගෙන නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ රු.1,967,241 ක මුදලින් රු.1,476,339 ක මුදලක් මේ වන විට ලැබී ඇත. මුද්දර ගාස්තු රු.20,847,893 ක මුදලින් රු.9,52,813 ක මුදලක් මේ වන විට ලැබී ඇත. | හිඟ හිටි උසාවි දඩ සහ මුද්දර ගාස්තු ගෙන්වා ගත යුතුය. |

### 2.2.3 අධිභාර

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ 226(1) විධිවිධාන අනුව විගණකාධිපති විසින් 1994,2004 සහ 2007 වර්ෂවලදී පනවා තිබුණු අධිභාර 03 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විටත් රු.3,754,000 ක් අය කරගෙන නොතිබුණි. | අධිභාර වී ඇති මුදල් අය කරගැනීම සඳහා අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඒ අනුව ක්‍රියාත්මක වෙමින් පවතින බව. | අධිභාර කඩිනමින් අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව එකතු වන කසළ ටොන් 15ක් පමණ කසළ අංගනයට රැගෙන ගොස් කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදාගෙන තිබුණු අතර, නොදිරන කසළ සහ දිරාපත් වන කසළ ටොන් 25ක් පමණ දීර්ඝ කාලයක් කසළ අංගනයේ සීමිත ඉඩ කඩක් යටතේ පොහොර නිෂ්පාදනයට යොදා නොගෙන රඳවා තබා ගෙන තිබුණි. | එකතු කරනු ලබන කසළ වර්ගීකරණය කිරීම සිදු කරනු ලබයි. එයින් ආර්ථික වටිනාකමක් ඇති ප්‍රතිචක්‍රීකරණය කළ හැකි ද්‍රව්‍ය අලෙවි කිරීමට කටයුතු සිදු කරන අතර, දිරාපත් වන කසළ කොම්පෝස්ට් පොහොර ලෙස සකස් කර අලෙවි කිරීම සිදු කරන බව. | විධිමත්ව කසළ බැහැර කර පොහොර නිෂ්පාදනයට හෝ ප්‍රතිචක්‍රීයකරණයට ලක් කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක 1980/46 හා 1980 දෙසැම්බර් 31 දිනැති පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය අනුව බදු කුලිය වසර 05 කට වරක් සංශෝධනය කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනය වන විටත් කඩ කාමර 697 ක් සම්බන්ධයෙන් 2015 වර්ෂය පදනම් කරගත් තක්සේරු කුලිය අය කරමින් තිබුණි. | කඩකුලී අය කිරීමට අදාළව තක්සේරු වාර්තා ලබාදෙන ලෙස තක්සේරු කාර්යාලය වෙත දැනුම් දී ඇති අතර තක්සේරු වාර්තා ලැබී ඇති කඩ සම්බන්ධයෙන් තක්සේරු වාර්තා අනුව අය කිරීමට කටයුතු කර ඇති බව. | බදු කුලිය වසර 05 කට වරක් සංශෝධනය කර ආදායම් වර්ධනය කරගත යුතුය. |
| (ආ) | සභාවට අයත් රු 4,625,000.ක් වූ ධාවනයෙන් ඉවත්කර තිබුණු වාහන ක් අපහරණය 05 එම ,කිරීම සඳහා සභා අනුමැතිය ලැබී තිබුණද කාශනයේ තත්ත්ව පිළිබඳ ප්‍රවත්කම් මූල්‍ය දේපල පිරියත හා උපකරණ තුළදක්වා තිබුණි. | වාහන අපහරණයට අදාළව සභා තීරණය ලැබී තිබුණ ද අපහරණ කටයුතු සියල්ල අවසන් වී නොමැති නිසා 2022 ගිණුම මඟින් එය දේපළ පිරියත හා උපකරණ ගිණුම තුළ දක්වා ඇති බව. | නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදුල්ල සේනානායක උද්‍යානයේ ආපනශාලාව 2001 අගෝස්තු 30 දින සිට රු.5,000 ක මාසික බදු කුලියකට ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමට වසර 25 කට අතුරු බදු දී තිබුණි. ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව ගිවිසුම වසර 05 න් 05 ට අලුත් කරවා ගත යුතු වුවද, එලෙස කටයුතු කර නොතිබුණු අතර, ගිවිසුමේ කොන්දේසි කඩ කරමින් මාර්ගය අවහිර වන පරිදි වෙළඳසැල ඉදිරිපසට යාබදව නව කොටසක් එක් කර තිබුණි. | 2014 වර්ෂයේදී තක්සේරු වාර්තාවක් ඉල්ලා ඇති අතර, 2016 වර්ෂයේදී ලද තක්සේරු වාර්තාව මත කඩකුලී සංශෝධනය කර ඇත.<br>2022 දෙසැම්බර් 05 දින ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර වාර්තාවක් ලබාගැනීමට කටයුතු කර ඇත. එම වාර්තාවට අනුව, නව තක්සේරුවක් සඳහා ඉල්ලුම් කළ අතර මාසික වාරිකය රු.58,500 ක තක්සේරුවක් 2023.04.26 දින ලැබී ඇත. ඒ අනුව මාසික කඩකුලිය සංශෝධනය කර අය කිරීමට පියවර ගෙන ඇති බව. | ගිවිසුමෙහි කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතු අතර, අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | බදුල්ල, රිදීපාන ප්‍රදේශයේ අක්.22 රූඩ්.01 පර්.05 ක විශාලත්වයෙන් යුතු "රිදීපානවත්ත" නැමැති ඉඩම බදුල්ල මහා නගර සභාවේ නගරාධිපති, සභිකයන් සහ එහි කාර්ය මණ්ඩලයට අවලංගු කළ නොහැකි ආකාරයෙන් 1994 ජූනි 29 වන දිනැතිව ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ තෑගි ඔප්පුවකින් බදුල්ල මහා නගර සභාවට පවරාදී තිබුණි. එවකට හිටපු නගරාධිපති විසින් අවිධිමත් පරිදි එතෙක් බදුල්ල මහා නගර සභාව විසින් භුක්ති විඳිමින් තිබූ ඉහත ඉඩමේ අයිතිය මහා නගර සභාවේ නගරාධිපති තනතුරට සහ ඉඩමේ ඇටෝර්නි බලකරුට පැවරෙන පරිදි නැවත වැරදි නිවැරදි කිරීමේ ඔප්පුවක් මඟින් සංශෝධනය කර තිබුණි. | බදුල්ල රිදීපාන වත්ත ඉඩම සම්බන්ධයෙන් සඳහන් කර ඇති කරුණු සනාථ කරන බව. | මහා නගර සභාවට අයත් දේපළ ආරක්ෂා කර ගත යුතුය. |

## 3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) (i) | 2008 වර්ෂයේ සිට 2014 දක්වා බදුල්ල තානායම් ගොඩනැගිල්ල බාහිර පාර්ශ්වයකට මාසික කළමනාකරණ ගාස්තුවක් යටතේ රු 150,000.කට බදුදීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2008 ජනවාරි 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2009 පෙබරවාරි 19 දිනැති අංක 1589/20 දරන ගැසට් පත්‍රයෙන් තානායම් ගොඩනැගිල්ල මහා නගර සභාවට පවරා දී තිබුණු අතර, 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා අය කරගත යුතු | තානායම් ගොඩනැගිල්ලෙන් අය වීමට නියමිත හිඟ මුදල වෙනුවෙන් අධිකරණමය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ හිටි කළමනාකරණ ගාස්තු අය කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.2,975,280 ක් වූ හිඟ කළමනාකරණ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වාම අය කරගෙන නොතිබුණි. | | |
| (ii) | බදුල්ල නගර මධ්‍යයේ පිහිටි ඉහළ වාණිජ වටිනාකමින් යුතු කාමර 20 ක් සහිත තානායම් ගොඩනැගිල්ල 2017 වර්ෂයේ සිට 2020 ජූනි දක්වා මහා නගර සභා කාර්යාලය පවත්වාගෙන යාමට භාවිතා කර තිබුණු අතර, මහා නගර සභා කාර්යාලය එම ගොඩනැගිල්ලෙන් ඉවත්ව ගොස් තිබුණද, 2020 ජූනි සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වාම කිසිදු ආදායම් උත්පාදන කාර්යයකට එම තානායම් ගොඩනැගිල්ල භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | එම ගොඩනැගිල්ල ආදායම් උත්පාදන මාර්ගයක් බවට පත් කිරීමට මහා සභා තීරණයන් අවස්ථා කිහිපයකදී ගන්නා ලද බව. | සභාව සතු වත්කම් ආදායම් උත්පාදන කාර්යයකට යෙදවිය යුතුය. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 හි (1) කොටසේ 13.2 ඡේදයේ මුදල් රෙගුලාසි 770(4) යටතේ රාජ්‍ය ආයතන වල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම හෝ ක්‍රියාත්මක තත්ත්වයට පත් කළ හැකි වාහන අලුත්වැඩියාව සඳහා අවශ්‍ය කටයුතු සිදුකළ යුතු වුවද, සභාව සතු වටිනාකම රු.8,570,000 ක් වූ භාවිතයෙන් ඉවත් කළ කාලය හඳුනාගත නොහැකි වාහන 08 ක් සම්බන්ධයෙන් ඉහත ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | වාහන අපහරණය සඳහා අවශ්‍ය ලිපි ලේඛන පළාත් සභාව වෙත යොමු කර ඇති අතර ,HV – 80 මාර්ග තලනය අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇත . UPKG – 5849 දරණ ජීප් රථය පළාත් සභාව මගින් අප වෙත ලබා දී ඇති අතර එය අළුත්වැඩියාව සඳහා විශාල වියදමක් වැයවන හෙයින් නැවත පළාත් සභාවට භාර දීම සඳහා ලිපි යොමු කර ඇති බව. | වාහන සම්බන්ධයෙන් යොමුගත රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

පාරිසරික ගැටළු

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 1947 අංක 16 දරන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 129 (ඇ) වගන්තිය අනුව බදුල්ල් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැසිකිළි වලෙහි එකතු වන මල අපද්‍රව්‍ය සෘජුවට බදුල්ල බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයේ කාණු පද්ධතියට බැහැර වන ලෙසට සකස් කර තිබුණි. ප්‍රධාන මාර්ගයේ විදුලි ආලෝක සංඥා පද්ධතිය අසළින් ගමන් කරන මහජනතාව මළ අපද්‍රව්‍ය දුර්ගන්ධයෙන් දැඩි පීඩාවකට පත් වන අතර, එම තත්ත්වය නිවැරදි කිරීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ගොඩනැඟිල්ල සඳහා අදාළ සැළසුම් අනුමත කිරීමේ බලධාරියා වන්නේ නාගරික සංවර්ධන අධිකාරියයිකෙසේ . වෙතත් මතුව ඇති මෙම සෞඛ්‍ය ගැටළුව සම්බන්ධයෙන් පවත්වන ලද සාකච්ඡාවන්හිදී සභාවේ අදහස් හා යෝජනාව ලබා දී ඇති අතර මල අපද්‍රව්‍ය බැහැර කරලීම නිවැරදි කරන ලෙස දැනුම් දෙන ලද බව. | මහජනතාව පීඩාවකට පත් **නොවන** ලෙස මල අපද්‍රව්‍ය විධිමත්ව බැහැර කළ යුතුය. |